# ප්‍රාදේශීය පුවත් - මාතර




    

    

| 2018 ජනවාරි - ජූනි | ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ අර්ධ වාර්ෂික පුවත් සඟරාව | වෙළුම 2 |
|---|---|---|

## දැනුවත් කිරීමේ වැඩසටහන්

# විධිමත් මූල්‍ය ආයතන හා සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ පවතින විධිමත් මූල්‍ය ආයතන හා සේවාවන් පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, පාසල් හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, ගුරුවරුන්, ව්‍යවසායකයන් සහ මහජනතාව දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

මෙම වැඩසටහන් තුළ දී මූල්‍ය පද්ධතියක ක්‍රියාකාරීත්වය, මූල්‍ය අතරමැදිකරණය, බැංකු හා මූල්‍ය සේවා පරිසරය හඳුනා ගැනීම, මූල්‍ය පද්ධතිය තුළ පවත්නා විධිමත් හා අවිධිමත් මූල්‍ය ආයතන හඳුනා ගැනීම සහ ඒවායේ පවතින්නා වූ නීතිමය පරිසරය හඳුනා ගැනීම යන කරුණු පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී.

වැඩසටහන් සංඛ්‍යාව - 16
සහභාගී වූ සංඛ්‍යාව - 1568

### සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා 2018 ජනවාරි මස 17 වන දින සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන








### මොරවක කීර්ති අබේවික්‍රම ජාතික පාසලේ සිසුන් සඳහා 2018 පෙබරවාරි මස 21 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන







## දැනුවත් කිරීමේ වැඩසටහන්

මාතර අධ්‍යාපන කලාපයේ ගුරුභවතුන් සඳහා 2018 මාර්තු මස 09 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන



වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුතු රාජ්‍ය නිලධාරීන් සඳහා 2018 මාර්තු මස 15 වන දින වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වූ වැඩසටහන



මාතර දිස්ත්‍රික් සමූපකාර සමිතිවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා 2018 අප්‍රේල් මස 03 වන දින මාතර සෝලිස් හෝටලයේ දී පැවැත් වූ වැඩසටහන



බෙන්තොට රන්තොටුවිල සමෘද්ධි ප්‍රජාව සඳහා 2018 අප්‍රේල් මස 04 වන දින බෙන්තොට
මහ ඌරගහ ශ්‍රී සුනන්දාරාම විහාරස්ථානයේ දී පැවැත් වූ වැඩසටහන





බෙන්තොට මිරිස්වත්ත සමෘද්ධි ප්‍රජාව සඳහා 2018 අප්‍රේල් මස 04 වන දින බෙන්තොට ඇතුංගාගොඩ විජයාරාම
විහාරස්ථානයේ දී පැවැත් වූ වැඩසටහන





හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වෙසෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා ග්‍රාමීය ප්‍රජාව
සඳහා 2018 මැයි මස 03 වන දින හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන





ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ වෙසෙන සමෘද්ධි ප්‍රජාව සඳහා 2018 මැයි මස 17 වන දින ලුණුගම්වෙහෙර පුරාණ රජ මහා විහාරයේ දී පැවැත් වූ වැඩසටහන



තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් සඳහා 2018 මැයි මස 21 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත් වූ වැඩසටහන



## දැනුවත් කිරීමේ වැඩසටහන්

### අනවසර මුදල් ව්‍යාපාර හා තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ දක්වා විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නා වූ අවසර නොලත් මුදල් ව්‍යාපාර මෙන්ම තහනම් යෝජනා ක්‍රම (පිරමීඩ) පිළිබඳව දැනුවත් කිරීමත්, එවැනි මුදල් ව්‍යාපාරවල ගණුදෙනු කිරීමට පෙළඹෙන ජනතාව ඉන් වළක්වාලීමත් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී.

එහි දී අනවසර මුදල් තැන්පතු භාර ගැනීම සහ නීති විරෝධී මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නීතිමය පසුබිම පිළිබඳව ග්‍රාමීය ප්‍රදේශවල පවත්වනු ලබන වැඩසටහන් ඔස්සේ මෙම පණිවිඩය ගමට ගෙන යාම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් මෙම වැඩසටහන් පවත්වන ලදී.

වැඩසටහන් සංඛ්‍යාව - 05
සහභාගී වූ සංඛ්‍යාව - 604

### 2018 ජනවාරි මස 17 වන දින පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් - 104

සම්පත් දායකත්වය : වයි. වයි. රණවීර මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව



## 2018 පෙබරවාරි මස 15 වන දින පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් - 125

සම්පත් දායකත්වය : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව





## 2018 පෙබරවාරි මස 16 වන දින කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් - 131

සම්පත් දායකත්වය : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව





## 2018 අප්‍රේල් මස 26 වන දින කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් - 124

සම්පත් දායකත්වය : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව





## 2018 අප්‍රේල් මස 27 වන දින කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් - 120

සම්පත් දායකත්වය : එන්. ඒ. ඒ. විජේසිරි මයා - ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ, නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව





## දැනුවත් කිරීමේ වැඩසටහන්

### අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන් හි පාසැල් හා විශ්වවිද්‍යාල විසින් කරන ලද ඉල්ලීම් මත ඔවුන් විසින් සංවිධානය කරනු ලැබූ අධ්‍යාපනික ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන ඇතුළත් ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබීය. මෙහි දී එම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පිරිස් සඳහා මහ බැංකු ප්‍රකාශන පිළිබඳ දැනුවත් කර ඒවා අලෙවි කිරීමට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ක්‍රියාත්මක සහන පොලී ණය යෝජනා ක්‍රම පිළිබඳව, ව්‍යාජ මුදල් හඳුනා ගන්නා ආකාරය හා පිරිසිදු මුදල් නෝට්ටු භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳව සහ විධිමත් මූල්‍ය ආයතන හා සේවා පිළිබඳව ද දැනුවත් කිරීම් සිදු කරනු ලැබීය.

සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය විසින් සංවිධානය කරන ලද “Investors Day – 2018”අධ්‍යාපනික ප්‍රදර්ශනය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මහ බැංකු ප්‍රකාශන ඇතුළත් ප්‍රදර්ශන කුටියක් 2018 ජනවාරි මස මස 17 සහ 18 යන දිනයන් හි දී සබරගමුව විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වනු ලැබීය. එහි දී ව්‍යවසායකයින්, විශ්වවිද්‍යාල සිසුන් හා පාසැල් දරුවන් 1000 කට අධික පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන ඇතුළත් අපගේ ප්‍රදර්ශන කුටිය නරඹනු ලැබූහ.

මීට අමතරව, මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පිරිස් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මහතා විසින් ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ක්‍රියාත්මක සහන පොලී ණය යෝජනා ක්‍රම පිළිබඳව, ව්‍යාජ මුදල් හඳුනා ගන්නා ආකාරය හා පිරිසිදු මුදල් නෝට්ටු භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳව සහ විධිමත් මූල්‍ය ආයතන හා සේවා පිළිබඳව ද දැනුවත් කරනු ලැබීය.








ගැටමාන්න විජය ජාතික පාසල විසින් සංවිධානය කරන ලද “පිබිදෙන විජය – 2018,” අධ්‍යාපනික ප්‍රදර්ශනය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මහ බැංකු ප්‍රකාශන ඇතුළත් ප්‍රදර්ශන කුටියක් 2018 මැයි මස 24 සහ 25 යන දිනයන් හි දී එම විද්‍යාල පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වනු ලැබීය. එහිදී පාසල් ගුරුභවතුන්, පාසල් ශිෂ්‍යයන් හා මහජනතාව 500 කට අධික පිරිසක් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන ඇතුළත් අපගේ ප්‍රදර්ශන කුටිය නරඹනු ලැබූහ.

මීට අමතරව, මෙම ප්‍රදර්ශනය නැරඹීමට පැමිණි පිරිස් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා සහ කළමනාකරු (සංවර්ධන) එම්. පී. අනුර මහතා විසින් ව්‍යාජ මුදල් හඳුනා ගන්නා ආකාරය හා පිරිසිදු මුදල් නෝට්ටු භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳව සහ විධිමත් මූල්‍ය ආයතන හා සේවා පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලැබීය.







## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

### ව්‍යවසායකයන්ට නව තාක්ෂණය හඳුන්වා දීම.

වර්තමානයේ ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිරත ව්‍යවසායකයන්හට නව තාක්ෂණික ක්‍රමෝපායන් පිළිබඳ ඇති නොදැනුවත්කම එම ව්‍යාපාරවල වර්ධනයට ප්‍රධාන බාධාවක් වී ඇති බව අපගේ පසු විපරම් කටයුතුවල දී හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව, ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මඟ පෙන්වීම යටතේ තෝරා ගත් කර්මාන්තයන් හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර නව තාක්ෂණික දැනුම ලබා දීමේ වැඩසටහන් 03 ක් සංවිධානය කරන ලදී.

| | |
|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | : 03 |
| සහභාගී වූ සංඛ්‍යාව | : 108 |

### *උඳුන් ආශ්‍රිත නිෂ්පාදනයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන*

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් දකුණු පළාතේ බතික් හා ආහාර වර්ග නිෂ්පාදනය කරන ව්‍යවසායකයන් සඳහා සංවිධානය කරන ලද නවීන තාක්ෂණික වැඩසටහන 2018 මාර්තු මස 26 වන දින තිහගොඩ විදාතා සම්පත් මධ්‍යස්ථානයේ දී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා බතික්, රසකැවිලි, යෝගට්, බයිට්ස් සහ ආයුර්වේද නිෂ්පාදන ආදී උඳුන් ආශ්‍රිත නිෂ්පාදනයන්හි නිරත දකුණු පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 22ක් සහභාගි වූහ. එහි දී ඔවුන්ට සිය නිෂ්පාදන අවම පිරිවැයක් සහ ඉහළ ඵලදායිතාවයකින් යුක්තව සිදු කිරීමට අවශ්‍ය නව තාක්ෂණික ක්‍රමෝපායන් පිළිබඳව න්‍යායාත්මක දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට හැකි වූ අතර, ඒ තුළින් ඉදිරියේ දී ඔවුන්ගේ ව්‍යාපාරවල ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට සහ ව්‍යාපාර තවදුරටත් වර්ධනය කර ගැනීමට හැකිවේ යයි අපේක්ෂා කරයි.






## මැටි ආශ්‍රිත නිෂ්පාදනයන්හි අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීම පිළිබඳව නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන

මැටි ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයේ නිරත හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා මැටි ආශ්‍රිත නිෂ්පාදනයන්හි අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීම පිළිබඳව නව තාක්ෂණික දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා දීම සඳහා දෙදින පුහුණු වැඩසටහක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් 2018 මැයි මස 31 සහ ජුනි 01 යන දිනයන්හි දී කිරම, මාපිටකන්ද, ගල්ටැම්ගොඩ පුරාණ විහාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා මැටි ආශ්‍රිත නිෂ්පාදනයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 35 ක් පමණ සහභාගී වූහ. මෙහි දී නවීන තාක්ෂණය භාවිතා කරමින් මැටි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආකාරය, වර්තමාන වෙළඳපොල තත්ත්වයන්ට ගැලපෙන අයුරින් නිෂ්පාදනවල සිදු කළ යුතු වෙනස්කම් සහ වෙළඳපොල තුළ ඉහළ ඉල්ලුමක් ඇති මැටි ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ආකාරය පිළිබඳව ව්‍යවසායකයන්ට ඉහළ දැනුමක් ලබා ගැනීමට හැකියාව ලැබුණි.

මේ තුළින් ඉදිරියේ දී ව්‍යවසායකයන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරයි. මෙම වැඩසටහන අතරතුර ව්‍යවසායකයන් සිය ව්‍යාපාරයන්හි පවතින මූල්‍ය දුෂ්කරතාවයන් පිළිබඳ ප්‍රාදේශීය කළමනාකාරතුමාට කරුණු ඉදිරිපත් කළ අතර එහි දී ඔහු විසින් එම මූල්‍ය දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා වන කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් ලබා දෙන ලදී.








## ගඩොල් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පරිසර හිතකාමී ලෙස ගඩොල් නිෂ්පාදනය සිදු කිරීම පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන

වර්තමාන ලෝකයේ පරිසර දූෂණය බරපතල ම ගැටළුවක් බවට පත් වී ඇති අතර මේ නිසා සියළු පාර්ශවයන් පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීමේ ඇති වැදගත්කම අවබෝධ කර ගනිමින් සිටී. මේ නිසා වර්තමානයේ බොහෝ ව්‍යාපාරිකයන් සිය නිෂ්පාදන පරිසර හිතකාමී ලෙස සිදු කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන බව දක්නට ලැබේ. ඒ අනුව, වර්තමානයේ පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා ඉහළ වෙළඳපොල ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතී. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් මත ගඩොල් කර්මාන්තයේ නිරත මාතර දිස්ත්‍රිකකයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා පරිසර හිතකාමී ලෙස ගඩොල් නිෂ්පාදනය සිදු කිරීම පිළිබඳව නව තාක්ෂණික දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා දීම සඳහා එක් දින පුහුණු වැඩසටහනක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් 2018 ජුනි මස 18 වන දින අකුරුගොඩ ප්‍රජා ශාලාවේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා ගඩොල් කර්මාන්තයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 51 ක් පමණ සහභාගී වූහ. මෙහි දී නවීන තාක්ෂණය භාවිතා කරමින් පරිසර හිතකාමී ලෙස ගඩොල් නිෂ්පාදනය සිදු කිරීම පිළිබඳව සහ ඒ සඳහා භාවිතා කළ යුතු යන්ත්‍ර සූත්‍ර පිළිබඳව ව්‍යවසායකයන්ට කරුණු අවබෝධ කර ගැනීමට හැකියාව ලැබුණු අතර, ඒ මගින් ඉදිරියේ දී මෙම නිෂ්පාදන මහජනතාව අතර ජනප්‍රිය කරවීමට හැකියාව ලැබෙනු ඇත. එමෙන්ම ව්‍යවසායකයන්ට නවීන යන්ත්‍ර සූත්‍ර යොදා ගෙන සිය ව්‍යාපාරය පුළුල් කර ගැනීමට සහ ඉහළ ආදායමක් ලබා ගැනීමට හැකියාව ලැබේ යැයි අපේක්ෂා කරයි. තව ද, මෙම වැඩසටහන අතරතුර ප්‍රාදේශීය කළමනාකාරතුමා විසින් දැනට බැංකු හරහා ක්‍රියාත්මක සහන පොලී ණය යෝජනා ක්‍රම පිළිබඳව ද ව්‍යවසායකයන් දැනුවත් කරන ලදී.

තව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මෙම වැඩසටහන සඳහා සහභාගී වූ ව්‍යවසායකයන් හට මහා පරිමාණයෙන් පරිසර හිතකාමී ගඩොල් නිෂ්පාදන කටයුතු සිදු කරන ආයතනයක ප්‍රායෝගික අත්දැකීම් ලබා දීමේ අරමුණින් පරිසර හිතකාමී ගඩොල් නිෂ්පාදනයේ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රමුඛයෙකු වන කිතුලෙවෙල තරුණ මධ්‍යස්ථානයේ ක්ෂේත්‍ර චාරිකාවක් ද එදින ම සංවිධානය කළ අතර ඒ මගින් ව්‍යවසායකයන්හට එම කර්මාන්තය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.








## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

### ව්‍යවසායකයන්ගේ නිපුණතාවය සංවර්ධනය කිරීම

ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිපුණතාවයන් වර්තමාන වෙළඳපොල අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් නවීකරණය නොවීම නිසා ඔවුන්ගේ ව්‍යාපාරයන් වර්ධනයට සෘජුවම බලපෑම් කරන බව දැක ගත හැකිය. ඊට පිළියමක් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ උපදෙස් මත එවැනි බලපෑමක් සහිත තෝරා ගත් ව්‍යාපාරික ක්ෂේත්‍රයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිපුණතාවය වර්ධනය කිරීමේ අරමුණින් වැඩසටහන් 2 ක් සංවිධානය කරන ලදී.

| | |
|---|---|
| වැඩසටහන් සංඛ්‍යාව | : 02 |
| සහභාගී වූ සංඛ්‍යාව | : 127 |

### *බෑග් නිෂ්පාදනයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන නිපුණතා සංවර්ධන වැඩසටහන*

බෑග් නිෂ්පාදනයේ නිරත හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ බෑග් නිෂ්පාදනය සම්බන්ධයෙන් වන කුසලතාවයන් වර්ධනය කිරීමේ අරමුණින් නව තාක්ෂණික දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා දීම සඳහා තෙදින නිපුණතා සංවර්ධන වැඩසටහනක් 2018 මාර්තු මස 21, 22 සහ 23 යන දිනවල ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මේ සඳහා බෑග් නිෂ්පාදනයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 30 ක් පමණ සහභාගී වූහ.

මෙම වැඩසටහන තුළින් බෑග් නිෂ්පාදනය සඳහා වර්තමානයේ භාවිතා කරනු ලබන යන්ත්‍ර සූත්‍ර පිළිබඳව හඳුනා ගැනීමට හැකියාව ලැබීම සහ එවැනි යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් බෑග් නිෂ්පාදනය සිදු කරන ආකාරය පිළිබඳව, වර්තමාන වෙළඳපොල අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් නිෂ්පාදනවල සිදු කළ යුතු වෙනස්කම් සහ වෙළඳපොල තුළ ඉහළ ඉල්ලුමක් ඇති නව මෝස්තරයන්ගෙන් යුක්ත නිෂ්පාදන පිළිබඳව ව්‍යවසායකයන්ට දැනුම, පුහුණුව සහ අවබෝධය ලබා ගැනීමට හැකියාව ලැබුණි. මේ තුළින් ඉදිරියේ දී ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනවල ගුණත්වය ඉහළ නංවා ගැනීමට සහ වැඩි වෙළඳපොල ඉල්ලුමක් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කරයි.






## රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ නියුතු ශිල්පීන් සඳහා වන නිපුණතා සංවර්ධන වැඩසටහන

රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ නිරත හම්බන්තොට දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන එක් දින නිපුණතා සංවර්ධන වැඩසටහනක් 2018 අප්‍රේල් මස 24 වන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වේශ නිරූපණ ශිල්පියෙකු වශයෙන් සේවය කරන පී. ජේ. ජේ. බණ්ඩාර මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී. මේ සඳහා රූපලාවණ්‍ය ක්ෂේත්‍රයේ නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 97 ක් පමණ සහභාගී වූහ.

මෙම වැඩසටහන තුළින් නවීන රූපලාවණ්‍ය ශිල්ප ක්‍රම, ඒ සඳහා භාවිතා කරනු ලබන නව තාක්ෂණික උපකරණ පිළිබඳව සහ ප්‍රමිතියෙන් යුක්ත ආලේපන වර්ග භාවිතා කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව නිවැරදි සහ විස්තරාත්මකව කරුණු ව්‍යවසායකයන්හට දැන ගැනීමට හැකියාව ලැබී ඇත. මේ තුළින් ඉදිරියේ දී ඔවුන්ගේ සේවාදායකයන්හට ඉතා ඉහළ මට්ටමේ සේවාවක් සැපයීමට හැකිවනු ඇති අතර, ඒ මගින් ඔවුන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට ද හැකියාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.









## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

### යහපත් ව්‍යාපාරික පරිචයන් පිළිබඳව ව්‍යවසායකයන් දැනුවත් කිරීම

වර්තමානයේ වෙළඳපොල තුළ දක්නට ලැබෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ඇතැම් නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීම නීතිමය වශයෙන් අනිවාර්ය වුවත් ඒ පිළිබඳව ඇති නොදැනුවත්කම නිසා එම තත්ත්ව සහතික ලබා නොගෙන නිෂ්පාදන වෙළඳපොලට ඉදිරිපත් කිරීම හේතුවෙන් ඔවුන් විවිධ නීතිමය ගැටළුවලට ලක්වන අවස්ථා නිරන්තරයෙන් දැක ගත හැකිය.

එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නිෂ්පාදන පිළිගත් වෙළඳපොල වෙත යොමු වීමේ දී තත්ත්ව සහතික ලබා නොතිබීම හේතුවෙන් එම නිෂ්පාදනවල තත්ත්වය ඉහළ මට්ටමක පැවතිය ද ඒවා පිළිගත් වෙළඳපොල මගින් ප්‍රතික්ෂේප කෙරේ. ඒ අනුව, ඊට පිළියමක් වශයෙන් ප්‍රාදේශීය කළමනාකරුගේ උපදෙස් මත එවැනි බලපෑමක් සහිත නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නිරත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා “SLS” සහ “GMP” තත්ත්ව සහතික ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් මාතර දිස්ත්‍රික්කයේ සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා සංවිධනාය කරන ලද “SLS” සහ “GMP” තත්ත්ව සහතික ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 ජුනි මස 22 වන දින මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 67 ක් සහභාගී වූහ. මෙම වැඩසටහන තුළින් තත්ත්ව සහතික ලබා ගැනීමේ වැදගත්කම, එම සහතික ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් සහ ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙත් පිළිබඳව නිවැරදි හා විස්තරාත්මක කරුණු ව්‍යවසායකයන්හට දැන ගැනීමට හැකියාව ලැබී ඇත. මේ තුළින් ඉදිරියේ දී ඔවුන්ගේ ව්‍යාපාරයන්හි සිදු කරනු ලබන නිෂ්පාදන නිසි ප්‍රමිතියකට අනුකූලව වෙළඳපොලට ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත.



# ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

## පුහුණු වැඩසටහන් හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සිදු කරන ලද පසු විපරම් කටයුතුවලින් අනාවරණය වූ කරුණු මත පදනම්ව තෝරාගත් විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි දකුණු පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඉලක්ක කර ගනිමින් විවිධ පුහුණු වැඩසටහන් සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී.

වැඩසටහන් සංඛ්‍යාව : 04
සහභාගී වූ සංඛ්‍යාව : 281

## අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩසටහන

වර්තමානයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නිසි පරිදි අලෙවිකරණ උපක්‍රම භාවිතා නොකිරීම සහ පහසුවෙන් යොදා ගත හැකි නව තාක්ෂණික අලෙවිකරණ උපක්‍රම පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් තම නිෂ්පාදන අලෙවිකර ගැනීමට නොහැකි වීම නිසා නව ඇනවුම් ලබා ගැනීමට නොහැකි වීම සහ නිෂ්පාදන සඳහා හොඳ මිලක් ලබා ගැනීමට නොහැකි වීම වැනි ගැටළු රාශියක් ඇති වී ඇති අතර ඒ සඳහා විසඳුමක් ලෙස අප ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ “අලෙවිකරණය” පිළිබඳව ඇති දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා අලෙවිකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් රුහුණ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ අලෙවිකරණ දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය ඒ. බී. සිරිසේන මහතාගේ සම්පත් දායකත්වයෙන් 2018 පෙබරවාරි මස 26 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 33 ක් සහභාගී වූහ.









## ගිණුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන

ඇතැම් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නිසි පරිදි ගිණුම්කරණ කටයුතු පවත්වාගෙන නොතිබීම මූල්‍ය පහසුකම් ලබා ගැනීමට මෙන්ම එදිනෙදා ව්‍යාපාර දියුණුවට ඇති ප්‍රධාන බාධාවක් වී ඇති බව අපගේ පසු විපරම් කටයුතුවල දී නිරීක්ෂණය විය. එයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ක්‍රියාත්මක ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී සිටින ගාල්ල දිස්ත්‍රික් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූලික ගිණුම්කරණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා "ව්‍යවසායකයෙකු තම ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී ගිණුම් තැබීමේ ඇති වැදගත්කම සහ මූලික ගිණුම් තබා ගන්නා ආකාරය " පිළිබඳව එක් දින පුහුණු වැඩසටහනක් රුහුණ විශ්ව විද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කථිකාචාර්ය ආර්. ආර්. පී. කේ. ගුණරත්න මහතාගේ සම්පත් දායකත්වයෙන් 2018 මැයි මස 23 වන දින ගාල්ල සණස අධ්‍යාපන මණ්ඩප (සණස කැම්පස්) ශ්‍රවණාගාරයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 42 ක් සහභාගී වූහ.



## ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කය

DFCC බැංකුවේ ගාල්ල ශාඛාව සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ගාල්ල දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් 2018 මාර්තු මස 02 වන දින ගාල්ල දිස්ත්‍රික් වාණිජ මණ්ඩල ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 66 ක් සහභාගී වූහ. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතා සහ කළමනාකරු (සංවර්ධන) එම්. පී. අනුර මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.





## ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - මාතර දිස්ත්‍රික්කය

DFCC බැංකුවේ මාතර ශාඛාව සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් මාතර දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක් 2018 මාර්තු මස 06 වන දින දිශාන්වැලි තේ කර්මාන්තශාලා පරිශ්‍රයේ දී සාර්ථකව පැවැත්වුණි. මෙම වැඩසටහන සඳහා ව්‍යවසායකයන් 140 ක් සහභාගී වූහ. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කළමනාකරු (සංවර්ධන) සුමුදු ගුණරත්න මහතා සහ කළමනාකරු (සංවර්ධන) එම්. පී. අනුර මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.







## ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්

### අධ්‍යාපනික ක්ෂේත්‍ර චාරිකාව

ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන කිරි නිෂ්පාදනය රටේ පරිභෝජනය සඳහා ප්‍රමාණවත් නොවීම නිසා පසුගිය කාලය පුරාවටම විශාල වශයෙන් කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීමට සිදු වී ඇත. මේ නිසා විදේශ විනිමය විශාල වශයෙන් රටින් පිටතට ගලා යාමක් සිදු වන අතර ඒ තුළින් රටේ විනිමය අනුපාතය අවප්‍රමාණය වීමට මෙන්ම ගෙවුම් ශේෂයට ද අහිතකර බලපෑමක් සිදු වී ඇත. මේ නිසා රටේ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබා ගත හැක. ඒ අනුව, ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් මත ෆොන්ටෙරා සමාගම සමඟ ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් දකුණු පළාතේ කිරි නිෂ්පාදනයේ නිරතව සිටින කිරි ගොවීන් වෙත කිරි ගව පාලනය හා කිරි නිෂ්පාදනය පිළිබඳ නවීන හා නිවැරදි තාක්ෂණික දැනුම න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව ලබා දීමේ එක් දින අධ්‍යාපනික ක්ෂේත්‍ර චාරිකාවක් 2018 ජුනි මස 07 වන දින පන්නල ෆෝන්ටෙරා ආදර්ශන හා පුහුණු ගොවිපල පරිශ්‍රයේ දී ඉතා සාර්ථකව පැවැත්වුණි. මෙම ක්ෂේත්‍ර චාරිකාව සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කිරි ගෝවීන් 36 දෙනෙකු සහභාගී වූහ.

ෆොන්ටෙරා සමාගම කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීමේ ප්‍රමුඛ ආයතනයක් වන බැවින් ඔවුන් විසින් මෙම ක්ෂේත්‍ර චාරිකාවේ දී කිරි ගව පාලනය හා කිරි නිෂ්පාදනය සම්බන්ධව නවීන දැනුම, අත්දැකීම්, නිවැරදි භාවිතයන් පිළිබඳ දැනුම මෙන්ම කිරි ගොවීන්ගේ ගැටළු සඳහා වන විසඳුම් ලබා දෙන ලදී. විශේෂයෙන් ම වර්තමානයේ බොහෝ ව්‍යවසායකයන් දේශීය කිරි ගවයන් වෙනුවට විදේශීය කිරි ගවයන් අධික මිලකට මිල දී ගැනීම සඳහා යොමුවීමේ ප්‍රවණතාවයක් දැක ගත හැකිය. මෙසේ විශාල මුදලක් ආයෝජනය කර විදේශීය කිරි ගවයන් ආනයනය කළ විට එම කිරි ගවයන්ට අවශ්‍ය පරිදි අනෙකුත් පහසුකම් ද සලසා දිය යුතු බැවින් ඒ සඳහා ව්‍යවසායකයන්ට විශාල ආයෝජනයක් සිදු කළ යුතු වේ. එහි දී එම විදේශීය කිරි ගවයන් වෙනුවෙන් වූ අනෙකුත් පහසුකම් සැපයීම සිදු නොකරන්නේ නම් එම ආයෝජනය තුළින් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිවනු ඇත. නමුත් නිවැරදි ක්‍රමයට කිරි ගවයන් නඩත්තු කිරීම මගින් දැනට දේශීය කිරි ගවයන්ගෙන් ලබා ගන්නා කිරි නිෂ්පාදනයට වඩා ඉහළ නිෂ්පාදනයක් ලබා ගැනීමට හැකියාව ඇති බව ඔවුන්ට පෙන්වා දෙන ලදී. මේ තුළින් ව්‍යවසායකයන්ට සිය ආයෝජනයන් වඩා ඵලදායීව සිදු කිරීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කරන ලදී. එය ඔවුන්ගේ ව්‍යාපාරයේ ඉදිරි දියුණුවට ඉතා වැදගත්වනු ඇති අතර ඒ හරහා ව්‍යාපාරය වඩාත් වැඩි ඵලදායිතාවයකින් යුක්තව ක්‍රියාත්මක කරමින් රටේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකවනු ඇතැයි අපේක්ෂා කෙරේ.








## විශේෂ වැඩසටහන්

### සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ සේවාවන් පිළිබඳ ජංගම සේවා කඳවුර

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව හා කම්කරු කාර්යාලය සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සේවක අර්ථසාධක අරමුදල් සේවාවන් ලබා දීමේ පහසුකම තවදුරටත් පුළුල් කරමින් සේවක කේන්ද්‍රස්ථාන වෙත ගොස් ජංගම සේවා සැපයීමේ ක්‍රමවේදය යටතේ කොග්ගල නිදහස් වෙළඳ කලාපයේ සේවක සේවිකාවන් සඳහා සංවිධානය කරන ලද සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ සේවාවන් පිළිබඳ ජංගම සේවා කඳවුරක් 2018 ජනවාරි මස 30 වන දින කොග්ගල නිදහස් වෙළඳ කලාපයේ යුනිචෙලා ප්‍රයිවට් ලිමිටඩ් ආයතන පරිශ්‍රයේ දී අති සාර්ථක ලෙස පවත්වන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී කේ. එන්. එන්. එම්. බණ්ඩාර මහත්මියගේ සහ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ උපදෙස් හා පූර්ණ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ මෙම ජංගම සේවා කඳවුර සාර්ථක කර ගැනීමේ දී සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඒ. ජී. යූ. තිලකරත්න මහතා හා කාර්ය මණ්ඩලය සහ ගාල්ල කම්කරු කොමසාරිස් එන්. පී. මානගේ මහත්මියගේ දායකත්වය ද පිටිවහලක් විය. මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහක දායකත්වය සපයනු ලැබුවේ කොග්ගල යුනිචෙලා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය වන අතර, කොග්ගල නිදහස් වෙළඳ කලාපයේ සේවය කරනු ලබන සේවක සේවිකාවන් 600 කගේ පමණ සේවක අර්ථසාධක අරමුදල් ගැටළු නිරාකරණය කර ගැනීමට හැකි විය. මෙහි දී ලබා දුන් පහසුකම් අතර සේවක අර්ථසාධක අරමුදල් ගිණුමේ නම් හා හැඳුනුම්පත් අංක සංශෝධනය, නිවාස ණය ලබා ගැනීම පිළිබඳ දැනුවත් කිරීම, බී කාඩ්පත් නිකුත් කිරීම, ගිණුම් ශේෂ පත්‍ර නිකුත් කිරීම, ගිණුම් සංශෝධන සඳහා ලිපි ලේඛන භාර ගැනීම ආදිය විය.








## විශේෂ වැඩසටහන්

### කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හා ජනාධිපති ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති කළමනාකරණ අංශය සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ගාල්ල, මාතර, හම්බන්තොට සහ රත්නපුර දිස්ත්‍රික්කයන්හි කෘෂිකාර්මික හා ධීවර අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ බැංකුකරුවන් සඳහා සංවිධානය කරන ලද “කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP)” යටතේ ක්‍රියාත්මක සහන පොලී ණය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ එම්. සී. ඩී. ද  සිල්වා මහතා සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති කළමනාකරණ අංශයේ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනේ (SAPP) උපදේශක ධම්මික ගුණවර්ධන මහතා හා කලෙයිකුමරන් මහතා විසින් මෙම වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සපයන ලදී.

වැඩසටහන් සංඛ්‍යාව : 03
සහභාගී වූ සංඛ්‍යාව : 287

### මාතර හා ගාල්ල දිස්ත්‍රික් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

දිනය හා ස්ථානය : 2018 ජුනි මස 04 වන දින මහජන බැංකුවේ මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී
ඉලක්කගත කණ්ඩායම : මාතර හා ගාල්ල දිස්ත්‍රික්කයන්හි කෘෂිකාර්මික හා ධීවර අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ විධායක බැංකු නිලධාරීන් - 114



## විශේෂ වැඩසටහන්

### රත්නපුර දිස්ත්‍රික් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

දිනය හා ස්ථානය : 2018 ජුනි මස 21 වන දින පුස්සැල්ල පරකඩුවේ පිහිටි කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ දී
ඉලක්කගත කණ්ඩායම : රත්නපුර දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික හා ධීවර අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ විධායක බැංකු නිලධාරීන් - 95







### හම්බන්තොට දිස්ත්‍රික් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

දිනය හා ස්ථානය : 2018 ජුනි මස 22 වන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී
ඉලක්කගත කණ්ඩායම : හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික හා ධීවර අංශයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ විධායක බැංකු නිලධාරීන් - 78







## විශේෂ වැඩසටහන්

### විදේශ විනිමය පනත සහ මුදල් මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

මෑතක දී පාර්ලිමේන්තුවේ දී සම්මත කළ 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ ඇතුළත් කරුණු පිළිබඳව සහ මුදල් මෙහෙයුම් කළමනාකරණය පිළිබඳව දකුණු පළාතේ බැංකු නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් සංවිධානය කළ විදේශ විනිමය පනත සහ මුදල් මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සහකාර අධිපති ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ යූ. පී. අලවත්තගේ මහතාගේ සහභාගීත්වයෙන් 2018 ජනවාරි මස 26 දින මහජන බැංකුවේ මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී සාර්ථකව පැවැත්වුණි.

විදේශ විනිමය පනත පිළිබඳ දේශන සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ පී. වී. එස්. එම්. ෆොන්සේකා මහත්මිය සහ සහකාර අධ්‍යක්ෂ ටී. පී. කපුරුගේ මහත්මිය විසින් ද මුදල් මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ දේශනය සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධිකාරී පී. ඩී. ආර්. දයානන්ද මහතා විසින් ද සම්පත් දායකත්වය ලබා දුන් අතර වැඩසටහන සඳහා දකුණු පළාතේ බැංකු නිලධාරීන් 144 ක් සහභාගී වූහ.










## විශේෂ වැඩසටහන්

### අධ්‍යාපනික සම්මන්ත්‍රණය - 2017 වාර්ෂික වාර්තාවෙන් පිළිඹිබු වන ශ්‍රී ලංකාවේ ආර්ථිකය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ රාජගිරිය බැංකු විදු පියස සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් දකුණු පළාතේ ගුරුවරුන්, විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් සහ සිසු සිසුවියන් ඉලක්ක කර ගනිමින් 2017 වාර්ෂික වාර්තාවෙන් පිළිඹිබු වන ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ දැනුවත් කිරීමේ දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් 03 ක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය සපයන ලදී.

### මාතර දිස්ත්‍රික් අධ්‍යාපනික සම්මන්ත්‍රණය

2018 ජුනි මස 05 වන දින රුහුණ විශ්වවිද්‍යාලයීය මානව හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : මාතර දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන්, කථිකාචාර්යවරුන් සහ විශ්වවිද්‍යාල සිසුන් 225

සම්පත් දායකත්වය : ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව







### හම්බන්තොට දිස්ත්‍රික් අධ්‍යාපනික සම්මන්ත්‍රණය

2018 ජුනි මස 11 වන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන් - 51

සම්පත් දායකත්වය : කේ. ඒ. යූ. එස්. කේ. තිලකරත්න මහතා - ජ්‍යෙෂ්ඨ අර්ථශාස්ත්‍රඥ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව








## ගාල්ල දිස්ත්‍රික් අධ්‍යාපනික සම්මන්ත්‍රණය

2018 ජුනි මස 20 වන දින ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී

ඉලක්කගත කණ්ඩායම : ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් ගුරුවරුන් - 111
සම්පත් දායකත්වය : ආචාර්ය ඩී. එස්. ටී. වානගුරු මෙනවිය නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව



## ව්‍යාපාර පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට පළාත් මට්ටමින් වැඩි දායකත්වයක් ලබා දීමේ අරමුණින් කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශවල නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එහි දී එම වැඩසටහන් සඳහා සහභාගී වූ ව්‍යවසායකයන් එම වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසු සිය ව්‍යාපාරික කටයුතුවලට ධනාත්මක වෙනසක් අත්කර ඇති ද යන්න පිළිබඳ හඳුනා ගැනීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරයන්හි දිගු කාලීන වර්ධනය සඳහා සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබා දීමේ අරමුණින් පසු විපරමක් ද සිදු කරනු ලබයි.

මෙහිදී අප විසින් ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථානය වෙත ගොස් එහි කටයුතු නිරීක්ෂණය කිරීම සිදු කර අප විසින් හඳුනා ගන්නා ලද ඔවුන්ගේ ව්‍යාපාරය සතුව පවතින වර්තමාන ශක්තීන් සහ දුර්වලතා පිළිබඳවත් අනාගත වෙළඳපොල අවස්ථා සහ තර්ජන පිළිබඳවත් ඔවුන් වෙත කරුණු පැහැදිලි කිරීමක් සිදු කරනු ලබයි. 2018 පළමු අර්ධ වර්ෂය තුළ ව්‍යවසායකයන් 4 දෙනෙකුගේ ව්‍යාපාර පිළිබඳ පසු විපරම් සිදු කරන ලදී.

### එන්. ඩී. ජී. බන්දුල මහතාගේ ව්‍යාපාරය පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 ජුනි මස 30 වන දින පලොල්පිටියේ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් පවත්වනු ලැබූ ඵලදායී කුරුඳු නිෂ්පාදනය සිදු කිරීම සහ කුරුඳු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ කඹුරුපිටියේ එන්. ඩී. ජී. බන්දුල මහතාගේ ව්‍යාපාරය පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මූලිකත්වයෙන් සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මහතාගේ සහභාගීත්වයෙන් 2018 ජනවාරි මස 09 වන දින සිදු කරන ලදී.







## රත්න ප්‍රොඩියුසර්ස් සිනමන් එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 ජුනි මස 30 වන දින පලොල්පිටියේ ජාතික කුරුඳු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් පවත්වනු ලැබූ ඵලදායී කුරුඳු නිෂ්පාදනය සිදු කිරීම සහ කුරුඳු ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ කඹුරුපිටියේ රත්න ප්‍රොඩියුසර්ස් සිනමන් එක්ස්පෝට්ස් පුද්ගලික සමාගම පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මූලිකත්වයෙන් සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මහතාගේ සහභාගීත්වයෙන් 2018 ජනවාරි මස 09 වන දින සිදු කරන ලදී.







## බුසාරා කෙමිකල්ස් ආයතනය පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 වර්ෂයේ අම්බලන්තොට සහ මාතර පැවති වෙළඳපොළ සම්බන්ධීකරණ වැඩසටහන, වෙළඳ සල්පිල හා අලෙවි ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ සේදුම්කාරක නිෂ්පාදනයේ සහ බෙදාහැරීමේ නිරත මාතර දෙනිපිටියේ බුසාර කෙමිකල්ස් ආයතනය පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මූලිකත්වයෙන් සහ කළමනාකාර සහකාර ඒ. එස්. පී. පී. ශිරෝමාල් මහතාගේ සහභාගීත්වයෙන් 2018 මාර්තු මස 12 වන දින සිදු කරන ලදී.





## තිලෝනා නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳ පසු විපරම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සම්පත් දායකත්වය ලබා ගනිමින් 2017 අගෝස්තු මස 31 වන දින ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයීය පරිශ්‍රයේ දී පැවැත්වුණු එළවළු හා පළතුරු විජලනීකරණය කිරීම පිළිබඳ නව තාක්ෂණික දැනුම ලබා දීමේ පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ එළවළු හා පළතුරු ආශ්‍රිත සකස් කළ ආහාර නිෂ්පාදනයේ නිරත මුල්කිරිගල ප්‍රදේශයේ ජී. ජී. ජයන්ත මහතාගේ තිලෝනා නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳ පසු විපරමක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු මිගාර හඳුන්ගේ මහතාගේ මූලිකත්වයෙන් සහ කළමනාකාර සහකාර පී. එල්. පී. ඉමල්කා මහත්මියගේ සහභාගීත්වයෙන් 2018 මාර්තු මස 12 වන දින සිදු කරන ලදී.





## ව්‍යවසායක ගැටළු සඳහා විසඳුම් ලබා දෙමින් .......

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පවත්වනු ලබන වැඩසටහනකට සහභාගී වී පැමිණෙන අතරතුර බෙර කර්මාන්තයේ නිරත ව්‍යවසායකයන් පිරිසක් හමු වූ අතර එහිදී ඔවුන් බෙර කර්මාන්තය තුළ නිරත වීමේදී මුහුණ පෑමට සිදුවන මූල්‍යමය හා තාක්ෂණික ගැටළු පිළිබඳව ප්‍රාදේශීය කළමනාකාරතුමා වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

එහි දී ප්‍රාදේශීය කළමනාකාරතුමා විසින් ඔවුන්ගේ මූල්‍යමය ගැටළු විසඳා ගැනීමට අවශ්‍ය කරන උපදෙස් ලබා දීම සිදු කරන ලදී. එම මූල්‍යමය ගැටළු විසඳා ගැනීමේ දී විධිමත් මූල්‍ය ආයතන සමඟ සම්බන්ධ වීමේ ඇති වැදගත්කම සහ වර්තමානයේ බැංකු පද්ධතිය හරහා ක්‍රියාත්මක වන සහන පොලී ණය යෝජනා ක්‍රම කිහිපයක් පිළිබඳව ද කරුණු දැනුවත් කරන ලදී. තාක්ෂණික ගැටළු විසඳා ගැනීම සඳහා ඒ හා සම්බන්ධ තාක්ෂණික ආයතන පිළිබඳව දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.










## විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වාර්තා

### ජාතික පුවත්පත්



#### සේවක අර්ථ සාධක අරමුදල් කටයුතු පිළිබඳ ජංගම සේවයක්







#### උඳුන් ආශ්‍රිත නිෂ්පාදනයන්හි නිරත ව්‍යවසායකයන්ට නව තාක්ෂණික දැනුම





#### යෞවනයන් අතර අලෙවිකරණ වෘත්තිය ප්‍රවර්ධනයට SLIM NASCO පෙරමුණ ගනී

#### අවසර නොලත් මුදල් ව්‍යාපාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

#### බෑග් නිෂ්පාදන නිපුණතා වර්ධනය කිරීමේ තෙදින පුහුණු වැඩමුළුව









# විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වාර්තා

## ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය - ඉංග්‍රීසි

### Skill Development Programme



A "Skill Development Programme" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka with the collaboration of the District Office of Industrial Development Board, Hambantota for Bag Manufactures in the Hambantota District was successfully held from 21st to 23rd March 2018 at the auditorium of the District Office of Industrial Development Board, Hambantota. 30 entrepreneurs participated for the programme.

### The Exposure Visit for Dairy Farmers in the Southern Province



The Exposure Visit for Dairy Farmersin the Southern Provinceorganized by the Regional Office Matara, Central Bank of Sri Lanka was successfully held on June 07, 2018 at the Fonterra Demonstration and Training Farm, Pannala. 36 dairy farmers participated for the programme.

### "Modern Technology Programme" - Akurugoda, Kamburupitiya



The "Modern Technology Programme" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka for small and medium entrepreneurs engaged in the bricks industry in the Kamburupitiya Divisional Secretariat was successfully held on 18th June 2018 at the Community Hall, Akurugoda, Kamburupitya. 51 entrepreneurs participated for the programme.

### Public Lecture on "State of the Economy as Reflected in the Annual Report 2017" - Galle



The public lecture on "State of the Economy as Reflected in the Annual Report 2017" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka with the collaboration of the Center for Banking Studies, Rajagiriya and the Economic Research Department of the Central Bank of Sri Lanka for teachers in the Galle District was successfully held on June 20, 2018 at the auditorium of the District Secretariat, Galle. 111 teachers participated for the programme. The resource person of the programme was Dr. (Ms.) D.S.T. Wanaguru – Deputy Director of the Economic Research Department of the Central Bank of Sri Lanka.

### "Educational Seminar" - Nindana Maha Vidyalaya, Ambalangoda



An "Educational Seminar" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka for the students of Nindana Maha Vidyalaya, Ambalangoda was successfully held on 19th June 2018 at the auditorium of Regional Office Matara, Central Bank of Sri Lanka. 45 students participated for the programme.

### Awareness Programme on "Smallholder Agribusiness Partnerships Programme (SAPP)" - Hambantota



An awareness programme on "Smallholder Agribusiness Partnerships Programme (SAPP)" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka with the collaboration of Regional Development Department, Central Bank of Sri Lanka and the Project Management Unit – Presidential Secretariat for the senior government officers attached to agriculture and fisheries sectors and bankers in the Hambantota District was successfully held on June 22, 2018 at the auditorium of the District Secretariat, Hambantota. 78 government and bank officers participated for the programme.

### "Educational Seminar" - Thihagoda Maha Vidyalaya



An "Educational Seminar" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka for the students of Thihagoda Maha Vidyalaya was successfully held on 29th June 2018 at the auditorium of Regional Office Matara, Central Bank of Sri Lanka. 40 students participated for the programme.

### Awareness Programme on "Obtaining GMP and SLS Certificates" - Matara



An awareness programme on "Obtaining GMP and SLS Certificates" organized by the Regional Office Matara, Central Bank of Sri Lanka for small and medium entrepreneurs in the Matara District was successfully held on 22nd June 2018 at the auditorium of the Divisional Secretariat, Matara. 67 entrepreneurs participated for the programme.

## විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වාර්තා

### ශ්‍රී ලංකා මහ බැංකුවේ ෆේස්බුක් පිටුව



























## සේවක අභිප්‍රේරණ වැඩසටහන්

### සමබර ජීවිතයක් උදෙසා වන යෝග අභ්‍යාස හා සංයමය පිළිබඳ වැඩසටහන

යෝගා ආසනවල නිරත වීම මෙම කායික, මානසික සහ අධ්‍යාත්මික සුවය ඇති කරගෙන ජීවිතය සමබරව පවත්වාගෙන යාම සඳහා විශාල පිටිවහලක් වේ. විශේෂයෙන් ම යෝග ආසන ව්‍යායාම් ක්‍රමයක් පමණක් ම නොවේ. එය අධ්‍යාත්මික දියුණුවේ මාවතකි. එදිනෙදා ජීවිතයේ මුහුණපාන විවිධ බාධක හමුවේ අප බොහෝ දෙනා කායිකව මෙන්ම මානසිකවත් පිඩාවට පත් වෙයි. වර්තමානයේ දැඩි තරගකාරී ජීවන රටාව තුළ බොහෝ දෙනෙක් මානසික වශයෙන් විවිධ පීඩාවන්ට ලක් වන බව නිරන්තරයෙන් දැක ගත හැකි වෙයි.

මෙසේ මානසිකව ඇතිවන පීඩාවන් නිසා ඇතැම් විට පුද්ගලයන් කායික වශයෙනුත් රෝගී විය හැකිය. එම නිසා කායික සුවය මෙන්ම මානසික සුවය ඇති කර ගැනීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණක් වී ඇත.

ඒ අනුව, ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් මත ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන්ගේ කායික හා මානසික සුවය වර්ධනය කිරීමේ අරමුණින් යෝග අභ්‍යාස හා සංයමය පිළිබඳ වැඩසටහනක් 2018 මාර්තු මස 08 වන දින සිට ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනකම පස්වරු 04.15 සිට පස්වරු 05.45 දක්වා ජී. පී. වීරසේන මහතාගේ සම්පත් දායකත්වයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලයීය පරිශ්‍රයේ දී පැවැත්වෙන අතර මේ සඳහා ප්‍රාදේශීය කාර්යාලයේ නිලධාරීන් ඉතා උද්යෝගයෙන් යුතුව සහභාගී වෙයි.



## සේවක අභිප්‍රේරණ වැඩසටහන්

### මාසික ධර්ම දේශනා වැඩසටහන් මාලාව

සේවක මහත්ම මහත්මීන් හට ධර්මාවබෝධය ලබා දීම හරහා ඔවුන්ගේ මානසික දියුණුව ඇති කිරීම සහ ඒ තුළින් ඔවුන්ගේ ජීවිත ධර්මානුකූලව පවත්වාගෙන යාමට අවශ්‍ය මඟ පෙන්වීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2018 මාර්තු මස සිට මාසික ධර්ම දේශනා වැඩසටහන් මාලාවක් ප්‍රාදේශීය කළමනාකාරතුමාගේ උපදෙස් මත ආරම්භ කරන ලදී.

ධර්ම දේශනා වැඩසටහන සෑම මසකකම තෝරා ගත් දිනයක පස්වරු 12.30 සිට පස්වරු 01.30 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය තුළ සාර්ථකව පවත්වන ලදී. මෙම ධර්ම දේශනා වැඩසටහන් සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලයේ දැනට සේවයේ නියුතු නිලධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් විශ්‍රාම ගොස් සිටින නිලධාරීන් සහ ඒ බී සෙකියුරිටාස් ආයතනයේ නිලධාරීන් සහභාගී වූහ.





දිනය - 2018 මාර්තු මස 28 වන දින ප.ව. 12.30 සිට ප.ව 01.30 දක්වා

ධර්ම දේශනය මෙහෙයවීම - මාතර ඇලවේල්ල පාර ශ්‍රී පුෂ්පාරාම විහාරවාසී, ශාස්ත්‍රපති, පූජ්‍ය යටිගල ඥානසිරි හිමිපාණන් විසින්

අනුග්‍රහය - මාතර ප්‍රාදේශීය කාර්යලයේ සියළුම නිලධාරීන් විසින්

දිනය - 2018 අප්‍රේල් මස 25 වන දින ප.ව. 12.30 සිට ප.ව 01.30 දක්වා

ධර්ම දේශනය මෙහෙයවීම - මාතර වල්ගම ශ්‍රී බෝධිරුක්කාරාමාධිපති පූජ්‍ය විල්පිට සුදම්මාලංකාර නායක ස්වාමීන් වහන්සේ විසින්

අනුග්‍රහය - ශ්‍රී ලංකා මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගොස් සිටිය දී මෑතක දී අප අතරින් වියෝ වූ පියසේන විජේනායක මහතා වෙනුවෙන් ඔහුගේ ආදරණීය භාර්යාව සහ දියණියන් තිදෙනා විසින්





දිනය - 2018 මැයි මස 28 වන දින ප.ව. 12.30 සිට ප.ව 01.30 දක්වා

ධර්ම දේශනය මෙහෙයවීම - මාතර වල්ගම අනෝමරාමාධිපති, ශාස්ත්‍රවේදී, පණ්ඩිත පූජ්‍ය හක්මණ මදුරධම්ම ස්වාමීන්වහන්සේ විසින්

අනුග්‍රහය - මාතර ප්‍රාදේශීය කාර්යලයේ සියළුම නිලධාරීන් විසින්

දිනය - 2018 ජුනි මස 28 වන දින ප.ව. 12.30 සිට ප.ව 01.30 දක්වා

ධර්ම දේශනය මෙහෙයවීම - මාතර පුරාණ මන්තින්ද විහාරවාසී ස්වාමීන් වහන්සේ විසින්

අනුග්‍රහය - මාතර ප්‍රාදේශීය කාර්යලයේ සියළුම නිලධාරීන් විසින්




## මිනිස්කම

වල්වැදී ඇත මිනිස්කම
සොයා පීරා ගියද දන වෙත
අසීරුය ලබන්නට රුදුරු ලොව තුළ මිනිස්කම
තිබෙන ගුණ දහම් බිඳ ද
ගිලගමින් ඇත කුරිරු දන
ආත්මාර්ථය පෙරටු කොට
සියල්ලම සිදු විය යුතු බව
සිතන ලෝකයක් තුළ
කෙසේ දකිම් ද මිනිස්කම
මිල මුදල් මතුවෙලා
දුසිරිතය රජවෙලා බලයටම ලොල්වෙලා
හැකිවුන්ට ගැතිවෙලා

ආර්.එන්. හෙට්ටිආරච්චි මිය
ප්‍රාදේශීය කර්යාලය - මාතර